Department of Education,Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

**සතිය: 38**

**විෂය නර්තනය**

**ශ්‍රේණිය 13**

**සැකසුම:** දුල්මිණි මීගස්තැන්න.
ර/දොඩම්පෙ ශ්‍රී රාහුල මහා විද්‍යාලය

නිපුනතාවය:01නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.
නිපුනතා මට්ටම :1.3 ගායනය රහිත ව උඩරට /පහතරට /සබරගමු සාම්ප්‍රදායික නර්තන අංග ඉදිරිපත් කරයි.
ක්‍රියාකාරකම:1.3.3 යක්ඇනුම නර්තනය ඉදිරිපත් කරමු.(උඩරට සම්ප්‍රදාය )

## හිස්තැන් පුරවන්න .

1.කොහොඹාකංකාරියට සහභාගි වන සියලුම යක්දෙස්සන් වෙස්ඇදුම් කට්ටල ඇද ඉදිරිපත් කරන .......... වන රංගනය වේ.
2.යක් ඇනුම නර්තනයේදී වමතට............. සහ දකුණට .............රැගෙන නර්තනයේ යෙදීම සිරිතයි.
3.යක්ඇනුම නර්තනය කිරීමේ මූලික අපේක්ෂාව වනුයේ............................................................ ය.
4.කොහොඹාකංකාරියේ ගායනය සහිත නර්තන අංගයක් වන්නේ............................................ය.
5)යක් ඇනුම කොටස්...................... සමන්විතය.

## නිවැරදි පිළිතුර තෝරන්න .

6.යක්ඇනුම ,
1)ගායනය සහිත ඒකල නර්තන අංගයකි. 2)නාට්‍යමය පෙළපාලියකි.
3)ගායනා,නාට්‍යමය අවස්ථා ඇතුලත් අංගයකි . 4)ගායනා රහිත සමූහ නර්තනයකි.

7.යක්ඇනුම ආරම්භ වන්නේ,
1)ජිංදං,ජිංදං,ජිංදං,... 2)ජිංත කුකුද කුදකුද ගත
3)තකුද ගජිජි තකජිජිකුං 4)කුජිංතත්,කුජිංතත්තත්

8.යක්ඇනුම ආරම්භයේ සිට අවසානය දක්වා,
1)විලම්භ ලයෙන් ආරම්භ වී ක්‍රමයෙන් ලය වැඩිවේ. 2)ආරම්භයේ සිට මධ්‍ය ලයෙන් නර්තනය කෙරේ.
3)දෘත ලයෙන් ආරම්භ වී ක්‍රමයෙන් ලය අඩුවේ. 4)මධ්‍ය ලයෙන් ආරම්භ වී දෘත ලයෙන් අවසාන වේ.

9.යක්ඇනුමෙන් ආරාධනා කරනු ලබන දෙවිවරුන් පමණක් සදහන් වරණය වන්නේ,
1)අයියනායක,දැඩිමුණ්ඩ ,පත්තිනි 2)දෙවොල්,කළුකුමාර තුන්කට්ටුක්,වීරමුණ්ඩ තුන්කට්ටුවක්
3)කුඩා කොහොඹා,මහ කොහොඹා,කඩවර 4)කන්දේ පන්තිස් කට්ටුවක්,කතරගම ,වීරමුණ්ඩ

10.වෙස්ඇදුමින් සැරසී යක්ඇනුම නටනු ලබන්නේ,
1)ආධුනික ශිල්පීන් පිළිවෙලින් සිටගනිමින් ය. 2) ජ්‍යෙෂ්ඨත්වය හා ප්‍රවීණත්වය අනුව මුහුණට මුහුණලාය.
3)රංගභූමියේ තැනින් තැන විසිරී සිටිමින් ය. 4)ඉහත කිසි අයුරකින් නොවේ.

## සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .

11)යක්ඇනුම නර්තන අංගයෙහි පසුබිම හා සුවිශේෂ ලක්ෂණ පිළිබද ව විස්තර කරන්න .
12)අදාළ පද කොටස් තාල තබමින් කියන්න.
13)සම්ප්‍රදායික ලක්ෂණ අනුගමනය කරමින් බෙරවාදනයට අනුව යක්ඇනුමේ අදාළ කොටස් නර්තනය කරන්න .